# 18 බොදු ඇසින් ලොව බලමු

ඈත අතීතයේ සිට ම මිනිසා විශ්වය නිර්මාණය වී ඇති ආකාරය ගැන සිතන්නට විය. මේ නිසා තාරකා විද්‍යාව (Astronomy) දියුණු වී විශ්ව විද්‍යාව (Cosmology) නමින් විෂයයක් ද ඇති විය.

විශ්වයේ නිර්මාණය ගැන බොහෝ දෙනා පළ කළ අදහස්, ආගමික ස්වරූපයක් ගනී. පැරණි ඊජිප්තියන් (මිසර) ජනතාව ඛේනුම් (Khenumm) නැමැති දෙවියකු ලොව මවා හතෝර් (Hathor) දෙවඟන එයට ජීව හුස්ම පිඹ පණ ලබා දුන් බව විශ්වාස කළහ. චීන ජාතීන් විශ්වාස කළේ පන්කු (Panku) නම් දෙවියා ලොව මවා තමාගේ ඇටවලින් කඳු ද, මසින් පස ද, දත්වලින් යකඩ ද නිර්මාණය කළ බවයි.

බුදුදහමේ මූලික අරමුණ භෞතික ලෝකය පිළිබඳ විග්‍රහ, විවරණ ඉදිරිපත් කිරීම නොවේ. එහෙත් යම් යම් අවස්ථාවන්හි පැන නැගි කරුණු සාකච්ඡා කිරීමේ දී ඊට අවශ්‍ය ප්‍රමාණයට විශ්වය පිළිබඳ ඉදිරිපත් කරන ලද විවරණ බුදුදහමෙහි ඇතුළත් වෙයි. බුදුරදුන් වදාළ පරිදි ලෝක විෂය අචින්ත්‍ය ය. ඒ පිළිබඳ ප්‍රමාණය ඉක්මවා සිතීමෙන් මනස විකෘති වීමට ද ඉඩ ඇත. විශ්වයේ ආරම්භය හෝ අවසානය ගැන සෙවීම අර්ථ සම්පන්න වූවක් නො වේ. විශ්වයේ ආදී මූලයක් හෝ නිශ්චිත අන්තයක් හෝ පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කර නැත. එසේ වුව ද විශ්ව නිර්මාණය පිළිබඳ ව අවස්ථානුකූල ව ඉදිරිපත් කරන ලද කරුණු ඇතැම් විට නූතන තාරකා විද්‍යාවත්, විශ්ව විද්‍යාවත් ඉක්මවා යන ස්වරූපයක් ගන්නා බව පෙනේ.

**අග්ගඤ්ඤ** සූත්‍රයෙන් බුදුරජාණන් වහන්සේ හෙළි කළේ හේතුඵල සම්බන්ධතාව මත විශ්වයේ පරිණාමය සිදු වූ බව ය. බොහෝ කලෙක ඇවෑමෙන් කිසියම් සමයක දී මේ ලෝකය සංවර්තනය වන (හැකිලෙන) බවත්, නවත් බොහෝ කලකින් නැවත විවර්තනය වන (දිග හැරෙන) බවත් උන් වහන්සේ පෙන්වා දුන් සේක. විද්‍යාඥයෝ ද විශ්වය ස්ඵන්දමාන හෙවත් වරින්වර පිම්බෙන හැකිලෙන බව පැවසූහ. එය විස්තාරණය වී ඉන්පසු සමස්ත ශක්තිය එක ම පුංජයක් බවට හැකිලී විසිරී යාමක් සිදු වන බව, මහා පිපිරීම් වාදය (Big Bang Theory) ඉදිරිපත් කළ විද්‍යාඥයින්ගේ මතය යි. වසර බිලියන ගණනකට වරක් මෙ බඳු හැකිළීම් පිපිරීම් සිදු වන බව ඔවුහු පැවසූහ. වසර දෙදහස් පන්සිය පණහකට පෙර බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ ද ඊට සමාන අදහසකි.

බුදුදහමෙහි පටිච්චසමුප්පාදයෙන් උගන්වා ඇත්තේ විවිධ සාධක එකිනෙකට බලපාන අන්දමින් බැඳී පවත්නාබව ය. හැම පදාර්ථයක් ම තවත් පදාර්ථයක් හා හේතුඵල වශයෙන් සාපේක්ෂ ව බැඳී පවති යි. විශ්වය ද ක්‍රියාත්මක වන්නේ එසේ ය. විවිධ සාධක සමූහයකගේ ක්‍රියාකාරීත්වයෙන් විශ්වය පරිණාමය වෙයි. මේ හේතු වෙනස් වන විට විශ්වයේ දැනට පවත්නා ස්වරූපය ද වෙනස් වෙයි. මෙය ලෝක ස්වභාවය යි.

බුදුරජාණන් වහන්සේ භෞතික ලෝකය යනු සක්වළ සමූහයක් බව දේශනා කළ සේක. සඳ හිරු දෙදෙනකුගෙන් බැබළෙන ලෝකය සක්වළකි. මෙබඳු සක්වළ සහයක්. චූළනිකා සහස්සී ලෝකධාතුවයි. එහි ඉර හඳ දහස් ගණනකි. මෙබඳු චූළනිකා ලෝකධාතු දහසක් එක් ව **ද්විසහස්සි මජ්ඣිමිකා ලෝකධාතුව** සෑදේ. එබඳු ලෝකධාතු දහසක් එක්වීමෙන් **තිසහස්සී මහා සහස්සී** ලෝකධාතුව සෑදේ. එහි සක්වළ කෝටි සියයකි. බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරද්දී එම දේශනාව ඇසූ ඒ ඒ දේව කොට්ඨාස හා බ්‍රහ්ම කොට්ඨාස ප්‍රීතිඝෝෂා වශයෙන් ශබ්ද පැවැත් වූ බව ''සද්දමනුස්සාවේසුං'' යන්නෙන් පැහැදිලි ය. මෙම දේශනාව අවසානයේ දී දස සහසක් ලෝක ධාතු කම්පා වූ බව ද කියැවේ. අරුණවතී සූත්‍රයෙහි ''අභිභූ'' නම් රහතන් වහන්සේ සහශ්‍රී ලෝකධාතුවට ඇසෙන සේ ගාථා කී බව සඳහන් වෙයි.

විද්‍යාඥයින් දුරේක්ෂ වැනි සූක්ෂ්ම විද්‍යුත් උපකරණ භාවිත කර, පර්යේෂණ මගින් හෙළි කළ කරුණු බුදුරජාණන් වහන්සේ බුද්ධ ඥානයෙන් හෙළි කළ සේක. බුදුරජාණන් වහන්සේ චූලනිකා ලෝකධාතු මජ්ඣිමිකා ලෝකධාතු හා මහා සහස්සී ලෝකධාතු වශයෙන් ත්‍රිත්වයක් දක්වා ඇත. විද්‍යාඥයින් පවසන "සූර්යයා වටා ග්‍රහයෝ භ්‍රමණය වෙමින් යති, සෞරග්‍රහ මණ්ඩල සමූහයක් එක් වීමෙන් ලෝකධාතුවක් සෑදේ. " යන්න චූලනිකා ලෝකධාතුව පිළිබඳ විවරණයට සමාන ලෙස සැලකිය හැකි ය. ලෝකධාතු සමූහයක් එක් වීමෙන් ලෝකධාතු පුංජයක් සෑදේ යන්න මජ්ඣිමිකා ලෝකධාතු විවරණයට සමාන ලෙස ද ලෝක ධාතු විශාල සංඛ්‍යාවක් පවත්නා අතර, ඒවා සියල්ල එක් ව මහා ලෝක ධාතුව සකස් වෙයි " යන්න මහා සහස්සී ලෝක ධාතුව පිළිබඳ විවරණයට සමාන ලෙස ද සැලකිය හැකි ය.


තාරකා විද්‍යාඥයින් විශ්වය තුළ ක්‍රියාත්මක වෙමින් පවත්නා ගැලැක්සි (Galaxy) අනන්ත ප්‍රමාණයක් ඇති බව නිරීක්ෂණය කර ඇත. මෙම චක්‍රවාට පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ දේශනාව අභ්‍යවකාශ විද්‍යාව මගින් ඉදිරිපත් කර ඇති මෙම ගැලැක්සි සංකල්පයට සමාන වෙයි.

විද්‍යාඥයින් විසින් ඉහත දක්වන ලද චක්‍රවාට ඡායාරූප ගතකර අපට දැක බලා ගැනීමට සලස්වා ඇත. චන්ද්‍රයින්, සූර්යයින්, තාරකා විශාල ප්‍රමාණයක් ඇතිබව දක්වා ඇතත් මේ ග්‍රහලෝක හා සූර්යයන් කිසියම් ලක්ෂ්‍යයක් වටා භ්‍රමණය වෙමින් ද පරිභ්‍රමණය

වෙමින් ද ප්‍රතිපරිභ්‍රමණය වෙමින් ද පවත්නා බව සොයා ගෙන තිබේ. ඇතැම් චක්‍රවාටයක සූර්යයන් හා ග්‍රහ තාරකාවන් චක්‍රකාර (curcular) ගමන් මාර්ගයක හෝ අණ්ඩාකාර (Ellipical) ගමන් මාර්ගයක හෝ පරිභ්‍රමණය වන බව පෙන්වා දී ඇත. විසිවන සියවස වන විට චක්‍රවාට (Galaxy) හා තාරකා විශාල ප්‍රමාණයක් ඒකරාශී වී සැදුම්ලත් මන්දකිණී රාශියක් සොයා ගෙන තිබේ. මේවා පොකුරු වශයෙන් පීරිසි හෝ සර්පිලාකාර හැඩයට ගොනු ව ගැලැක්සි වශයෙන් සංවිධානය වී ඇත.

තාරකා බිලියන සියයක් පමණ ඇති ආලෝක වර්ෂ 60000 ක් පළල ක්ෂීරපථයෙහි අංශයක් ලෙස අප වසන පෘථිවිය හැඳින්විය හැකි ය. ක්ෂීරපථය ගැලැක්සි විසිහතරක පමණ පොකුරක එක් සාමාජිකයකු පමණි. ඇතැම් ගැලැක්සි පොකුරු මීට වඩා විශාල ය. වර්ගෝ (Vergo) ගැලැක්සි පොකුරෙහි ගැලැක්සි දහසක් පමණ ඇතුළත් ය. මේවා සූක්ෂ්ම විද්‍යුත් උපකරණ මගින් සොයා ගත් අතර බුදුරජාණන් වහන්සේ සර්වඥතාඥනයෙන් අවබෝධ කරගත්බව සූත්‍ර දේශනා තුළින් පැහැදිලි වෙයි. තුන්ලොව තතු දුටු බුදුරජාණන් වහන්සේගේ ඥනය නූතන විද්‍යාව ඉක්මවයි.

චක්‍රවාට



විශ්වයේ ජීවීන් වෙසෙන එක ම ස්ථානය පෘථිවිය පමණක් නො වන බවට අද කරුණු හෙළි දරවු වෙමින් පවතී. ඒ පිළිබඳ කරුණු සෙවීමෙහි විද්‍යාඥයෝ නිරත ව සිටිති. සම්බුද්ධ දේශනාවට අනුව පෘථිවියෙන් බැහැර විවිධ සක්වළවල ජීවීහු සිටිති. දේව බ්‍රහ්ම ආදී විවිධ නාමයන්ගෙන් ඔවුහු හැඳින්වෙති. එහෙත් ලෝකයේ කිසි ම තැනක සදාකාලික ව වෙසෙන ජීවීහු නැත්තාහ. මුළු ලෝක ධාතුවත් එහි වෙසෙන සියලු සත්ත්වයෝත් අනිත්‍යතාවට යටත් වූවෝ ය. විශ්වය මවන්නාවූ හෝ විනාශකරන්නාවූ හෝ බලධාරියෙක් ද නැත්තේ ය.

## සාරාංශය

තමන් වහන්සේ හමුවට ඉදිරිපත් වූ විවිධ ගැටලුවලට පිළිතුරු දීම් වශයෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රජාවට වාසස්ථානය වූ මේ භෞතික විශ්වය පිළිබඳ ව ද ප්‍රමාණවත් අවධානයක් යොමු කළහ. මූලික බෞද්ධ ඉගැන්වීම් සත්ත්වයාගේ සංයුතිය හා ස්වභාවය මෙන් ම විශ්වයේ ස්වභාවය ද හෙළි කරයි. නූතන විද්‍යාත්මක සොයා ගැනීම් සහ බෞද්ධ ඉගැන්වීම් සමාන වන අවස්ථා රාශියක් විද්වතුන් විසින් පෙන්වා දී ඇත. බුදුදහමෙහි සර්වකාලීන බව ද ඉන් පැහැදිලි වෙයි.

## ක්‍රියාකාරකම්

01. විශ්වය පිළිබඳ නූතන ඉගැන්වීම් තුනක් කෙටියෙන් දක්වන්න.
02. නූතන ඉගැන්වීම්වලට සමාන බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

## පැවරුම

01. බුදුරජාණන් වහන්සේගේ 'ලෝකවිදූ' ගුණය ගැන පාසලේ බෞද්ධ සඟරාවක පළ කිරීමට සුදුසු ලිපියක් ලියන්න.